# පරිගණක කෙවෙනි

## Computer Ports


10 වසර

මාර/ තෙලිජ්ජවිල මධ්‍ය විද්‍යාලය

Presented by :
Ms. H.P.H. Madhushika


# පරිගණක කෙවෙනි (Computer Ports)

- පරිගණකයට වෙනත් බාහිර උපාංග සම්බන්ධ කිරීමට යොදා ගනු ලබන අතුරු මුහුණත් **කෙවෙනි** නම් වේ.
- සියලුම කෙවෙනි මව් පුවරුවට සම්බන්ධ කර ඇත.



# PS/2 කෙවෙනිය

- මූසිකය සහ යතුරු පුවරුව සම්බන්ධ කිරීම සඳහා යොදා ගැනේ.
- දම් පැහැ කෙවෙනිය - යතුරු පුවරුව
- කොළ පැහැ කෙවෙනිය- මූසිකය



# සමාන්තර කෙවෙනිය (Parallel Port)

- සිදුරු 25ක් ඇත.
- මුද්‍රණ යන්ත්‍ර පරිගණකය හා සම්බන්ධ කිරීම සඳහා භාවිත කරයි.
- වර්තමානයේ භාවිත වන මුද්‍රණ යන්ත්‍රවල USB කෙවෙනි යොදා යනියි.




# ශ්‍රේණිගත කෙවෙනිය (Serial Port)

- තුඩු 9ක් හෝ 25ක් පවතී.
- අන්තර්ජාලයට සම්බන්ධවීමට භාවිත කරන මොඩමය පරිගණකය වෙත සම්බන්ධ කිරීමට යොදා ගනියි.
- වර්තමානයේදී ශ්‍රේණිගත කෙවෙනිය වෙනුවට USB කෙවෙනි මේ සඳහා යොදා ගනියි.



# ජාලකරණ කෙවෙනිය  (RJ 45 – Network Port)

- පරිගණක ජාල නිර්මාණයේදී, පරිගණකයක් ජාල මංහසුරුවට(Network Router)/ ජාල ස්විච්චය (Network Switch) වෙත සම්බන්ධ කිරීමට යොදා ගනියි.



# වීඩියෝ කෙවෙනිය (Video Port – VGA)


- විවර 15කින් යුක්ත වේ.
- ග්‍රැෆික් කෙවෙනිය ලෙසද හදුන්වයි.
- පරිගණක තිරය හෝ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය පරිගණක පද්ධතිය වෙත සම්බන්ධ කිරීමට යොදා ගනියි.



# HDMI කෙවෙනිය

පරිගණක තිරය, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය, ඩිජිටල් රූපවාහිනී යන්ත්‍ර හා ශබ්ද වාහිනී යන්ත්‍ර සම්බන්ධ කිරීමට යොදා ගනියි.

වර්තමාන ලැප්ටොප් පරිගණකවලද දැක ගත හැකිය.



# විශ්ව ශ්‍රේණිගත බස් කෙවෙනිය (USB Port) USB – Universal Serial Bus

- වර්තමානයේ භාවිත වන ආදාන හා ප්‍රතිදාන පරිගණකයට සම්බන්ධ කිරීමට යොදා ගනු ලබන්නේ USB කෙවෙනියයි.
- උදාහරණ :
    - මූසිකය
    - යතුරු පුවරුව
    - මුද්‍රණ යන්ත්‍ර
    - සුපරීක්ෂක
    - ඩිජිටල් කැමරා
    - බාහිර දෘඩ තැටි



# ශබ්ද උපාංග කෙවෙනිය (Audio Port)

- මයික්‍රොෆෝන, ස්පීකර, ඉස් බනුව වැනි ශ්‍රව්‍ය උපකරණ සම්බන්ධ කිරීමට යොදා ගනී.
- නිල් පාට - ශබ්ද ආදානය (Line in)
- කොළ පාට - ස්පීකර/ ශබ්ද ප්‍රතිදානය (Line out)
- රෝස පාට - මයික්‍රොෆෝනය (Mic)

